# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# UNIVERSITY OF SRI JAYEWARDENEPURA, SRI LANKA


| | | |
|---|---|---|
| දුරකථනය<br>Telephone | +94 11 2758000<br>+94 11 2802022 | නුගේගොඩ,<br>ශ්‍රී ලංකාව.<br>NUGEGODA,<br>SRI LANKA. |
| ෆැක්ස්<br>Fax | +94 11 2801843<br>+94 11 2802263 | තැපැල් පෙට්ටිය - 6, නුගේගොඩ.<br>Post Office Box - 6, Nugegoda. |
| විද්‍යුත් ලිපිනය<br>Email | info@sjp.ac.lk | |
| මගේ අංකය<br>My Number | USJP/NAE/12 | 2026.08.20 |
| ඔබේ අංකය<br>Your Number | | |


| | |
|---|---|
| ලේකම් | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, නො.20, වෝඩ් පෙදෙස, කොළඹ 07 |
| ලේඛකාධිකාරී | කොළඹ විශ්වවිද්‍යාලය, විද්‍යාල මන්දිරය, නො.94, කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ 03<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය<br>කැලණිය විශ්වවිද්‍යාලය, දළුගම, කැලණිය<br>මොරටුව විශ්වවිද්‍යාලය, බණ්ඩාරනායක මාවත, කටුබැද්ද, මොරටුව<br>යාපනය විශ්වවිද්‍යාලය, තැ.පෙ. 57, තිරුනෙල්වේලි, යාපනය<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, තැ.පෙ. 21, නාවල, නුගේගොඩ<br>රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර<br>නැගෙනහිර විශ්වවිද්‍යාලය, වන්තාරුමුලෙයි, චෙන්කලාඩි<br>ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, තැ.පෙ. 02, පඹහින්න, බෙලිහුල්ඔය<br>ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලය<br>ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාල උද්‍යානය, ඔලුවිල්<br>වයඹ විශ්වවිද්‍යාලය, ලයනල් ජයතිලක මාවත, කනදුල්ල, කුලියාපිටිය<br>ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, පස්සර පාර, බදුල්ල<br>සෞන්දර්ය හා කලා විශ්වවිද්‍යාලය, නො. 21, ඇල්බට් චන්ද්‍රවංකය, කොළඹ 07<br>ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, යක්කල, ගම්පහ<br>වව්නියා විශ්වවිද්‍යාලය, උද්‍යාන පාර, වව්නියාව |
| අධ්‍යක්ෂ | ඉංග්‍රීසි පශ්චාද් උපාධි ආයතනය, තැ.පෙ. 21, නාවල, නුගේගොඩ<br>දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, බණ්ඩාරනායකපුර, රාජගිරිය<br>පාලි හා බෞද්ධ පශ්චාද් උපාධි අධ්‍යයන ආයතනය, නො. 113, දුටුගැමුණු මාවත, කොහුවල<br>වෛද්‍ය විද්‍යා පශ්චාද් උපාධි ආයතනය, නො. 160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත, කොළඹ 07<br>කෘෂිකර්ම විද්‍යා පශ්චාද් උපාධි ආයතනය, පරණ ගලහ පාර, පේරාදෙණිය<br>කළමනාකරණ පශ්චාද් උපාධි ආයතනය, ලෙස්ලි රණගල මාවත, කොළඹ 08<br>පුරා විද්‍යා පශ්චාද් උපාධි ආයතනය, බෞද්ධාලෝක මාවත, කොළඹ 07<br>විද්‍යා පශ්චාද් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය<br>ජාතික පුස්තකාල හා තොරතුරු විද්‍යා ආයතනය, තැ.පෙ. 1698, කොළඹ විශ්වවිද්‍යාලය, කොළඹ 03<br>තාක්ෂණ විද්‍යා ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය, කටුබැද්ද, මොරටුව<br>විවෘත විශ්වවිද්‍යාලය මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානය, මහනුවර<br>ජෛව රසායන අනුක ජීව හා ජෛව තාක්ෂණ ආයතනය, නො. 90, කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ 03<br>මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය, නො. 20, වෝඩ් පෙදෙස, කොළඹ 07<br>මානව සම්පත් අභිවර්ධන ආයතනය, නො. 275, බෞද්ධාලෝක මාවත, කොළඹ 07<br>ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය, කල්ලඩි, මඩකලපුව<br>කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය, වැලිගත්ත නව නගරය, හම්බන්තොට<br>පරිගණක විද්‍යාලය, කොළඹ විශ්වවිද්‍යාලය, කොළඹ<br>අසාත්මිකවේද හා ප්‍රතිශක්තිවේද ආයතනය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ<br>මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය<br>වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය |
| මණ්ඩපාධිපති | ශ්‍රී පාලි මණ්ඩපය, වෑවල, හොරණ<br>ත්‍රිකුණාමලය මණ්ඩපය, කොනෙසපුරි, නිලාවේලි, ත්‍රිකුණාමලය |

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින මේ සමඟ අමුණා ඇති දැන්වීමේ සඳහන් තනතුරු සඳහා සුදුස්සන් තෝරා ගැනීමට මාර්ග ගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් කැඳවමින් නිකුත් කරන ලද දැන්වීම මේ සමඟ එවමි. මෙම දැන්වීම ඔබ ආයතනයේ සේවක භවතුන්ගේ දැනගැනීමට සලස්වන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ලේඛකාධිකාරී
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල, නුගේගොඩ.

# පුරප්පාඩු
# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, විශ්වවිද්‍යාලවල හා ඊට අනුබද්ධ උසස් අධ්‍යාපන ආයතන වල තනතුරේ ස්ථිර කරන ලද සේවක හවතුන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත් මාර්ගගත ක්‍රමවේදය මගින් පමණක් ඉදිරිපත් කළ යුතු අතර අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා මාර්ගගත ද්වාරය (Online Portal) **2026.08.21** දින පෙ.ව. **08.30** සිට **2026.09.04** දින ප.ව. **4.00** දක්වා විවෘතව පවතිනු ඇත. වැඩි විස්තර https://www.sjp.ac.lk/vacancies වෙබ් පිටුව මගින් ලබා ගත හැකි අතර මාර්ග ගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා https://hrms.sjp.ac.lk/vacancies/nonacademic/internal වෙත පිවිසිය යුතුය.

මාර්ගගත ක්‍රමවේදය මගින් සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි දෘඩ පිටපතක් මෙම විශ්වවිද්‍යාලයේ නම්, අදාළ අංශ ප්‍රධාන, අධ්‍යයනාංශ ප්‍රධාන, පීඨාධිපති මඟින්ද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ/විශ්වවිද්‍යාලයක/ආයතනයක/අනුබද්ධිත විශ්වවිද්‍යාලයක/මණ්ඩපයක නම් එහි ලේකම්/ලේඛකාධිකාරී/අධ්‍යක්ෂ/ආයතන ප්‍රධානියා/මණ්ඩපාධිපති මඟින් **2026.09.11** වන දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් **නියෝජ්‍ය ලේඛකාධිකාරී, අනධ්‍යයන ආයතන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ.** යන ලිපිනයට එවීමට පියවර ගත යුතුය. අයදුම්පත්‍රය බහාලන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ තනතුර සඳහන් කරන්න.

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලිවීම, සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල ඡායා පිටපත් අමුණා නොතිබීම සහ අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවේ. කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළවිට කුමන හේතුවක් නිසා හෝ යලි සලකා බලනු නොලැබේ.

මේ සම්බන්ධයෙන් වන විමසීම් සඳහා රාජකාරී දිනයන්හි පෙ.ව. 08.30 සිට ප.ව. 4.00 දක්වා 0112758212/102 දුරකථන අංක ඔස්සේ ඇමතිය හැක.

## 1. නියෝජ්‍ය ප්‍රධාන ආරක්ෂක නිලධාරී

**සුදුසුකම් :-**

(i) විශ්වවිද්‍යාල ආරක්ෂක සේවාවේ ආරක්ෂක පරීක්ෂක (I ශ්‍රේණිය) තනතුරේ වසර 03 කට නොඅඩු සතුටුදායක සේවයක් තිබිය යුතුයි.

වැටුප් පරිමාණය :- **රු. 61,275 – 18x890 –77,295 (මාසික) U-MN 2(II)**
(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම :- සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

## 2. වැඩ අධිකාරී (සිවිල්) II ශ්‍රේණිය

**සුදුසුකම් :-**

(i) ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව (NDT) හෝ ඊට සමාන සුදුසුකම් සහ එම සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රය පිළිබඳව වසර 04 ක පළපුරුද්ද.

සටහන : ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාවට අදාළ වසර 04 හි පුහුණු කාලසීමාව ඉල්ලුම් කරනු ලබන පළපුරුද්දට අදාළ නොවේ.

හෝ

(ii) ජාතික තාක්ෂණික සහතිකපත් පාඨමාලාව (NCT) හෝ ඊට සමාන සුදුසුකම් සහ එම සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රය පිළිබඳ වසර 10 ක පළපුරුද්ද.

වැටුප් පරිමාණය :- රු. **61,275 – 18x890 –77,295 (මාසික) U-MN 2(II)**
(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම :- සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**3. <u>සැලසුම් ශිල්පී (පහළ ශ්‍රේණිය)</u>**

**සුදුසුකම් :-**

(i) පිළිගත් රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් ආයතනයක සැළසුම් ශිල්පය පිළිබඳ විභාගය සමත්ව තිබීම.

වැටුප් පරිමාණය :- රු. **51,095-7x540; 10x640- 60,575 (මාසික) U-MT 1(III)**
(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම :- සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**4. <u>හෙද නිලධාරී (II ශ්‍රේණිය)</u>**

**සුදුසුකම් :-**

(i) දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයන් තුනකට (03) කට සම්මාන සාමාර්ථ සහිතව, විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් විය යුතුය.

සහ

(ii) හෙදියක වශයෙන් ප්‍රවීණතාව ලබා ඇති බවට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව පිළිගත් සහතිකය ලබා සිටිය යුතුය.

වැටුප් පරිමාණය :- රු. **51,095-7x540; 10x640- 60,575 (මාසික) U-MT 1(III)**
(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම :- සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**5. <u>මහජන සෞඛ්‍ය පරීක්ෂක (III ශ්‍රේණිය)</u>**

**සුදුසුකම් :-**

(i) සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂක විභාගය සමත් වීම.

වැටුප් පරිමාණය :- රු. **51,095-7x540; 10x640- 60,575 (මාසික) U-MT 1(III)**
(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම :- සම්මුඛ පරීක්ෂණයක් මගින්.

## 6. තාක්ෂණික නිලධාරී (ශ්‍රව්‍ය දෘශ්‍ය) III ශ්‍රේණිය

**සුදුසුකම් :-**

(i) අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් ඕනෑම විෂය ධාරාවක් යටතේ එක් වරකදී විෂයයන් තුනක් (03) සමත් ව තිබීම.

සහ

(ii) (අ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගත් ආයතනයකින් හෝ පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලද පනතකින් පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයකින් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ / ඉලෙක්ට්‍රොනික / බහුමාධ්‍ය (Multimedia) හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණ (Audio Visual Techniques) ක්ෂේත්‍රයේ N.V.Q මට්ටම 5 ට නොඅඩු කුසලතා සහතිකයක් (Certificate of Proficiency) ලබා තිබීම.

හෝ

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) අධීක්ෂණය යටතේ පවතින විශ්වවිද්‍යාල මගින් පිරිනමනු ලබන අදාළ ක්ෂේත්‍රවල ඩිප්ලෝමා පාඨමාලාවක් (SLQF 3 සහ 4 හෝ NVQ 5 සහ 6) සමත්ව තිබීම.

හෝ

(ඇ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ඉහත (ii) (a) හි සඳහන් සුදුසුකමට සමාන යැයි පිළිගනු ලබන ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ / ඉලෙක්ට්‍රොනික / බහුමාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණ ක්ෂේත්‍රයේ තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම සමග පිළිගත් ආයතනයක ශ්‍රව්‍ය දෘශ්‍ය (Audio Visual) කටයුතු පිළිබඳ වසරක පළපුරුද්දක් තිබීම.

**සටහන :-** පාඨමාලාවට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ Level) තහවුරු කිරීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (Tertiary and Vocational Education Commission) මඟින් නිකුත් කරන සමානතා සහතිකයක් (Certificate of Equivalence) ඉදිරිපත් කළ යුතුය.

වැටුප් පරිමාණය :- **රු. 51,095-7x540; 10x640- 60,575 (මාසික) U-MT 1(III)**
(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම :- ලිඛිත හා/හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

## 7. තාක්ෂණික නිලධාරී (සිවිල්) III ශ්‍රේණිය

**සුදුසුකම් :-**

(i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් භෞතික විද්‍යා විෂය ධාරාවෙන් හෝ තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ ඉංජිනේරු තාක්ෂණවේදය (ET) / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදය (ICT) යන විෂයයන්ගෙන් එක් වරකදී විෂයයන් තුනකින් (03) සමත් වී තිබීම.

සහ

(ii) සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ හෝ ඊට සමාන ක්ෂේත්‍රයක තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් හෝ පිළිගත් ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකමේ 5 වන මට්ටම (NVQ 5) හෝ ඊට නොඅඩු මට්ටමක ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම.

**සටහන :-** පාඨමාලාවට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ Level) තහවුරු කිරීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (Tertiary and Vocational Education Commission) මඟින් නිකුත් කරන සමානතා සහතිකයක් (Certificate of Equivalence) ඉදිරිපත් කළ යුතුය.

වැටුප් පරිමාණය :- රු. **51,095-7x540; 10x640- 60,575** (මාසික) **U-MT 1(III)**
(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම :- ලිඛිත හා/හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**8. <u>කළමනාකරණ සහකාර (පොත් තැබීම) III ශ්‍රේණිය</u>**

**සුදුසුකම් :-**

1. අ.පො.ස (සා/පෙළ) විභාගයේදී

    (i) සිංහල භාෂාව/දෙමළ භාෂාව
    (ii) ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය
    (iii) ගණිතය

    යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06ක් එක් වරකදී සමත් වී තිබීම.

සහ

2. අ.පො.ස (උ/පෙළ) විභාගය එක් වරකදී ගණකාධිකරණය ඇතුලුව සියලු විෂයයන් සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

(අ) පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 06 කට නොඅඩු පිළිගත හැකි පරිගණක යෙදුම් පාඨමාලාවක් හදාරා තිබීම.

සහ

(ආ) පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර 02 ක පළපුරුද්ද

<u>තනතුරට විශේෂිත වූ සුදුසුකම්</u>

ඉහතින් දක්වා ඇති සුදුසුකම් වලට අමතරව අයදුම්කරුවන් කළමනාකරණ සහකාර (පොත් තැබීම) තනතුරට විශේෂිත වූ පහත දක්වා ඇති සුදුසුකම් සපුරාලිය යුතුය.

(අ) නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා තාක්ෂණික විද්‍යාලය / තාක්ෂණ විද්‍යාලය (College of Technology) මගින් පිරිනමනු ලබන ගණකාධිකරණ තාක්ෂණික ශිල්පීන් සඳහා වූ ජාතික සහතිකය (National Certificate for Accounting Technicians) ලබා තිබීම හෝ පිළිගත් ආයතනයකින් ඊට සමාන වෙනත් සුදුසුකමක් ලබා තිබීම.

හෝ

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සුදුසුකම වාණිජ විෂය ධාරාවෙන් ලබා තිබීම.

වැටුප් පරිමාණය :- රු. **49,475-17x540 - 58,655** (මාසික) **U-MN 1(III)**
(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම :- ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

සටහන :- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
මනා චරිතවත් පුද්ගලයකු විය යුතුය.

9. <u>පරිපාලක (සිවිල්/විදුලි) III ශ්‍රේණිය</u>

**සුදුසුකම් :-**

(අ) තාක්ෂණවේදී ජාතික සහතිකය (NCT) හෝ ඊට සමාන සුදුසුකම් සමඟ NCT පාඨමාලාව හදාරන අතරතුර ලබාගත් වසර 03 ක පළපුරුද්ද;

හෝ

(ආ) රජයේ, පළාත් පාලන හෝ රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ පරීක්ෂකවරයෙකු/සුපරීක්ෂකවරයෙකු ලෙස අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද සහිතව, වාර 02 කට නොවැඩි ගණනකදී විෂයන් 06 කින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

වැටුප් පරිමාණය :- රු. **49,475-17x540 - 58,655** (මාසික) **U-MN 1(III)**
(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම :- සම්මුඛ පරීක්ෂණයක් මගින්

10. <u>පරිපාලක (භූමි දර්ශක) III ශ්‍රේණිය</u>

**සුදුසුකම් :-**

(අ) (i) වාර 02 කට නොවැඩි ගණනකදී විෂයන් 06 කින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

සහ

(ii) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන වසරක ප්‍රායෝගික කෘෂිකාර්මික පුහුණු පාඨමාලාව හෝ ඊට සමාන පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම.

හෝ

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක සේවය කරන අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය වාර 03 කට නොවැඩි ගණනකදී සමත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, උසස් අධ්‍යාපන ආයතනයක හා/හෝ උද්භිද උද්‍යානයක භූ දර්ශන කටයුතු පිළිබඳ වසර 10 ක පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් පරිමාණය :- රු. **49,475-17x540 - 58,655** (මාසික) **U-MN 1(III)**
(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම :- සම්මුඛ පරීක්ෂණයක් මගින්

11. <u>වෘත්තීය ශිල්ප පුදර්ශක III ශ්‍රේණිය (යාන්ත්‍රික / වෑද්දුම්)</u>

**සුදුසුකම් :-**

(i) පහත සඳහන් ක්ෂේත්‍ර එකක හෝ ඊට වැඩි ගණනක පළපුරුද්ද තිබිය යුතුය.

වාත්තු වැඩ, පෑස්සුම් සහ කම්හල් වැඩ, යාන්ත්‍රික උපාංග, රටා සැකසීම, තහඩු වැඩ, වඩු වැඩ, ලෝහ වැඩ.

<u>සටහන</u> : ඉහත සඳහන් ක්ෂේත්‍රයන්ගෙන් එකකට වැඩි ගණනක් සඳහා පළපුරුද්ද ඇති අය කෙරෙහි ප්‍රමුඛත්වය දක්වනු ලැබේ.

සහ

(ii) විශ්වවිද්‍යාල / රාජ්‍ය සේවයේ හෝ පිළිගත් ආයතනයක පුහුණු ශිල්පියෙකු ලෙස අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද ලබා තිබීම.

හෝ

(iii) විශ්වවිද්‍යාලයක / රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් ආයතනයක අවම වසර තුනක කාලයක් ඉහත අංක එක (i) යටතේ සඳහන් විෂය ක්ෂේත්‍රයක විශේෂ ශ්‍රේණියේ පුහුණු ශිල්පියෙකු වශයෙන් සේවයේ යෙදී තිබීම.

වැටුප් පරිමාණය :- රු. **49,475-17x540 - 58,655 (මාසික) U-MN 1(III)**
(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම :- ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 12. පිහිනුම් තටාක සුපරීක්ෂක (III ශ්‍රේණිය)

**සුදුසුකම් :-**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) හෝ උසස් අධ්‍යාපන ආයතනයක U-MN 1(III) වැටුප් පරිමාණයට නොඅඩු ආරම්භක වැටුප් පරිමාණයක් සහිත ස්ථිර තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ස්ථිර කරන ලද සේවකයෙකු වීම.

හෝ

(ආ) සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව හෝ සාහිත්‍යය සහ ගණිතය ඇතුළුව සම්මාන සාමාර්ථ පහක් (05) සහිතව වාර දෙකකට (02) නොවැඩි ගණනකදී විෂයයන් හයකින් (06) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

පිළිගත් ආයතනයක් හෝ සංගමයක් මඟින් පහත සඳහන් කුසලතා පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය.

(අ) පිහිනීම සහ මූලික පිහිනුම් ක්‍රම 4ක් (Four basic swimming strokes) ඉගැන්වීමේ හැකියාව.
(ආ) ප්‍රථමාධාර සහ ජීවිත ආරක්ෂක.
(ඇ) පරිගණක සාක්ෂරතාවය අමතර සුදුසුකමක් වේ.

වැටුප් පරිමාණය :- රු. **49,475-17x540 - 58,655 (මාසික) U-MN 1(III)**
(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම :- වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්

## 13. රියදුරු III ශ්‍රේණිය

**සුදුසුකම් :-**

(i) බර වාහන පැදවීමේ දක්ෂතාවය පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් තිබිය යුතු අතර, බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රිය පැදවීම පිළිබඳ අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතුය.

සහ

(ii) ප්‍රාථමික මට්ටමේ අර්ධ පුහුණු (U-PL 2) හෝ ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL 1) තනතුරක වසර 05 සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ තනතුරෙහි තහවුරු කර තිබීම.

වෙනත් :

I. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
II. තනතුරේ රාජකාරී හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
III. මනා චරිතවත් පුද්ගලයෙකු විය යුතුය.

වැටුප් පරිමාණය :- රු. **48,005 - 16x490 – 55,845 (මාසික) U-PL 3(III)**
(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම :- වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**14. <u>පැස්සුම්කරු (III ශ්‍රේණිය)</u>**

**සුදුසුකම් :**

1. ප්‍රාථමික මට්ටමේ අර්ධ පුහුණු (U-PL 2) හෝ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම හා ඉහත එක් එක් තනතුරුවල කාර්යයට අදාළ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

2. ප්‍රාථමික මට්ටමේ අර්ධ පුහුණු (U-PL 2) හෝ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම හා අදාළ තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවමය වසර පහක (05) සේවා පළපුරුද්දක් සමඟ ඉහත එක් එක් තනතුරුවල කාර්යයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 2 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා ලබා ඇති බව වෘත්තීය පරීක්ෂණයකින් සනාථ කර තිබීම.

සටහන :- පාඨමාලාවට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ Level) තහවුරු කිරීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (Tertiary and Vocational Education Commission) මඟින් නිකුත් කරන සමානතා සහතිකයක් (Certificate of Equivalence) ඉදිරිපත් කළ යුතුය.

වෙනත් :

I. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
II. තනතුරේ රාජකාරී හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
III. මනා චරිතවත් පුද්ගලයෙකු විය යුතුය.

වැටුප් පරිමාණය :- රු. **48,005 - 16x490 - 55,845 (මාසික) U-PL 3(III)**
(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම :- වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**15. <u>ක්‍රීඩාගාර සහායක (III ශ්‍රේණිය) / විද්‍යාගාර සහායක (III ශ්‍රේණිය) / ලේත් යන්ත්‍ර ක්‍රියාකරු (III ශ්‍රේණිය) / නිදර්ශක එකතුකරන්නා (III ශ්‍රේණිය) / ට්‍රැක්ටර් ක්‍රියාකරු (III ශ්‍රේණිය)</u>**

**සුදුසුකම් :**

1. වර්තමාන තනතුරේ සේවය තහවුරු කර ඇති ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන පහත සුදුසුකම් සපුරා ඇති සේවකයින්.

(අ) අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) දෙකක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත් වී තිබීම සහ තනතුරට අදාළ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකමේ NVQ 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) දෙකක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත්වී තිබීම සහ අදාල විෂය ක්ෂේත්‍රයේ වසරක (01) සේවා පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

2. වර්තමාන තනතුරේ සේවය තහවුරු කර ඇති ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන හා කාර්මික කුසලතා සහිත තනතුරට අදාළව අවමය වසර පහක (05) සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින්.

**සටහන :-** පාඨමාලාවට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ Level) තහවුරු කිරීම සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (Tertiary and Vocational Education Commission) මඟින් නිකුත් කරන සමානතා සහතිකයක් (Certificate of Equivalence) ඉදිරිපත් කළ යුතුය.

**වෙනත්:**

I. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
II. තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
III. මනා චරිතවත් පුද්ගලයෙකු විය යුතුය.

**වැටුප් පරිමාණය :- රු. 44,575 - 16x490 - 52,415 (මාසික) U-PL 2(III)**
(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගැනීම :-** වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**ලේඛකාධිකාරී**
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල, නුගේගොඩ.
20.08.2026